# කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්.

### 1.2.1 ගිණුම් ප්‍රතිපත්ති

ණයගැතියෝ, වියදම්, පරිත්‍යාග සහ ආදායම් ගිණුම් තැබීමේ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සරෙක් ව්‍යාපෘතිය අවසන්වීමෙන් පසු ව්‍යාපෘතියට අදාල බැංකු ගිණුම පියවා තිබුණද එම ව්‍යාපෘතියට අදාලව වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තබූ රු.5,155,572 ක මුදල නිරවුල්කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලවූ වියදම් 2012 වර්ෂයට අදාල වියදම් ලෙස ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම් රු.232,780 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) එකතුව රු.687,244 ක්වූ අවුරුදු 01 කට වැඩි කාලයක් පවතින ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ හා ප්‍රකාශන සඳහා ලැබී තිබූ අරමුදල් වලින් 2011 වර්ෂය අවසාන වන විටද වර්ෂයේ වියදම් ලෙස හඳුනා නොගත් වියදම් වෙනුවෙන්ද රු.523,000 ක වෙනත් නිළධාරීන් තිදෙනෙකු නමින් උපචිත වියදම් ලෙස වෙන්කර තිබුණි.

(ඉ) ශේෂපත්‍රයේ ජංගම වත්කම් යටතේ තොග ගැලපුම් ගිණුම ලෙස රු.41,505 ක ශේෂයක් 2007 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

## 1.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ක්‍රියාත්මක අභ්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘති වියදම් වශයෙන් රු. 3,911,015 ක් වැය කර ඇති අතර එක් එක් ව්‍යාපෘති වෙනුවෙන් තොරතුරු ඇතුලත් ලිපි ගොණු ලේඛණ හා ප්‍රගති වාර්තා ඉදිරිපත් නොවූ බැවින් එම වියදම් වල නිවැරදිතාවය සනාථ කරගත නොහැකි විය.

## 1.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 මුදල් රෙගුලාසිය | කාර්යය නිමකළ විගස ලබාගත් අත්තිකාරම් පියවියයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 22කදී ලබාගත් මිශ්‍ර අත්තිකාරම් රු. 349,750 ක් ද අවසථා 10ක දි ලබාගත් පර්යේෂණ අත්තිකාරම් රු.758,980 ක්ද මාස 02 සිට මාස 05 දක්වා ප්‍රමාදවී පියවා තිබුණි. |
| (ආ) අංක 95 හා 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසන් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීණතා දීමනා ලෙස රු.70,242 ක් ගෙවා තිබුණි. |
| (ඇ) අංක 45 හා 2011 අප්‍රේල් 07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය | 2011 වර්ෂයේදී සිදුකරන ලද පර්යේෂණ පිළිබඳ වාර්තා 2011 දෙසැම්බර් 31 දිනට පෙර ආයතනයට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 09 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා ලෙස ගෙවීම් කරන ලද රු.1,155,120 කට අදාල පර්යේෂණ වාර්තා ආයතනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 36,540,333 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.30,801,301 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 32,494,457ක ප්‍රදාන හේතු කොටගෙන එම ඌනතාවය රු.4,045,876 ක් දක්වා අඩුවී තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.33,639,960 ක ප්‍රදාන හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු.2,838,659 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,884,535 ක පිරිහීමක් සඳහා සේවක වැටුප් හා වේතන වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අධ්‍යයන කාර්ය සාධනය

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010/2011 අධ්‍යයන වර්ෂයේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 02 ක්ද විද්‍යාපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා 01 බැගින්ද පවත්වා තිබූ අතර ලියාපදිංචි වී තිබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 106 ක් විය. පසුගිය අධ්‍යයන වර්ෂයේදී පවත්වා තිබූ උරුම අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබුණි.

(ආ) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 45 දෙනෙකු 2010/2011 අධ්‍යයන වර්ෂයේ දී ලියාපදිංචි වී තිබූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව 32.3% කින් එම පාඨමාලාව සඳහා ශිෂ්‍ය ලයාපදිංචිය වැඩිවී තිබුණද විද්‍යාපති (පුරාවිද්‍යා) පාඨමාලාව සඳහා සිසුන් 43 දෙනෙකු 2010/2011 අධ්‍යයන වර්ෂයේදී ලියාපදිංචිවී තිබූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව 8.5% කින් අඩුවී තිබුණි.

(ඇ) <u>ඒක ශිෂ්‍ය පිරිවැය</u>

2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 346,418 ක් වු අතර, 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 432,820 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේදි පසු ගිය වර්ෂයට සාපේක්ෂව ඒක ශිෂ්‍ය පිරිවැය 25% කින් වැඩි වී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නීලගිරි සෑය හා හැඩඔය නිම්නයේ යෝජිත ගවේෂණය සඳහා රු.648,600 ක ඇසතමේන්තුවක් මෙම ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා රු.500,000 ක් වෙන්කර දී තිබුණි. මෙම ප්‍රතිපාදන යොදාගෙන 2011 අගෝස්තු මස ගවේෂණ අවසන් කර තිබුණද ඒ සම්බන්ධ අවසන් වාර්තා 2012 මැයි 31 දින වන විටත් නිකුත් කර නොතබූනි.

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) ප්‍රාග්ධන හා පුනරාවර්තන කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් දෙකෙහි සමාලෝචිත වර්ෂය තුල අවම තැන්පතු ශේෂය පිළිවෙලින් රු. 9,854,289 ක් හා රු.6,019,467 ක වශයෙන් සාමාන්‍ය ඉතිරියක් පැවති අතර එම අතිරික්ත මුදල් කෙටිකාලීන ආයොජනයක යොදවා ආදායම් උපයා ගැනීම කෙරේහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන වර්ෂ ගණනාවක සිට ඌන උපයෝජිතව පැවති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට එසේ ඌන උපයෝජිතව පැවති ප්‍රතිපාදනවල වටිනාකම රු.7,381,803 ක් විය.

## 3.4 පුස්තකාල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසාන වන විට වටිනාකම රු. 62,455 ක් වු පුස්තකාල පොත් 37 ක් ආපසු භාරදී නොතිබූණි.

## 4. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත දැනුම් දෙන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) විවිධ අත්තිකාරම්

(ඇ) පුස්තකාල පරිපාලනය